චක්‍රලේඛ අංක :- එච්ආර්ඩී/ඊකිව්ඩී/2002/26


දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister } 784807, 784832

ලේකම් / செயலாளர் / Secretary } 784811

කාර්යාලය / அலுவலகம் / Office } 785141-50, Fax: 784846

ඊමේල්/மின்னஞ்சல்/E-mail : secedu@sltnet.lk

මානව සම්පත් සංවර්ධන, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

மனித வள அபிவிருத்தி, கல்வி, பண்பாட்டு அலுவல்கள் அமைச்சு

Ministry of Human Resources Development, Education & Cultural Affairs

පාසල් කටයුතු ශාඛාව

'ඉසුරුපාය', ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ බත්තරමුල්ල.

'இசுருபாய' ஸ்ரீ ஜயவர்தனபுர கோட்டை, பத்தரமுல்ல.

"Isurupaya", Sri Jayawardhanapura Kotte, Battaramulla.


ඔබේ අංකය / உமது இல. / Your No. } ....................

මගේ අංකය / எமது இல. / My No. } 2/පා.කළ.සුප/04/25

දිනය / திகதி / Date } 2002.10. 04

සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම පාසල් ප්‍රධානීන් වෙත.

## විදේශගත වන සිසුන් සඳහා නිවාඩු

විදේශගතවන සිසුනට නිවාඩු ලබාදීම සම්බන්ධයෙන් දැනට බලපැවැත්වෙන 2000.06.06 දිනැති 2000/29 දරණ චක්‍රලේඛය හා 2000.11.22 දිනැති 2000/29(I) දරණ චක්‍රලේඛ සංශෝධනයද අහිබවා මෙම චක්‍රලේඛය බල පැවැත්වේ ඇත.

02. මින් ඉදිරියට විදේශගතවන සිසුන් සඳහා නිවාඩු ලබාදීමේදී ඔවුන්ගේ ශිෂ්‍යභාවය තීරණය කළ යුත්තේ පහත සඳහන් කොන්දේසිවලට යටත්වය.

i. ශිෂ්‍යයකු විදේශගතවීම සඳහා නිවාඩු ඉල්ලුම් කළවිට පළාත් පාසලක ශිෂ්‍යයකු සම්බන්ධයෙන් නම් පළාත් අධ්‍යක්ෂකට නිවාඩු අනුමත කළ හැකි අතර ජාතික පාසලක ශිෂ්‍යයකු සම්බන්ධයෙන් නම් පළාත් අධ්‍යක්ෂගේ නිර්දේශය සහිතව අනුමැතිය සඳහා ජාතික පාසල් අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතුය.

ii. ශිෂ්‍යයකු අදාළ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ අනුමැතිය සහිතව හෝ මාගේ අනුමැතිය සහිතව හෝ මාස 06 ක් හෝ ඊට අඩු කාල පරිච්ඡේදයකට විදේශගත වී සිට ආපසු පැමිණිවිට එම පාසලේ ඉගෙනුම ලැබීමට විදුහල්පති විසින් ඉඩ ලබා දිය යුතුය. එසේ නිවාඩු විඩීමත් ලෙස ලබා ඇති ශිෂ්‍යයකු විදේශගත වී සිට මාස 6ක් ඇතුළත ආපසු නොපැමිණියහොත් එම ශිෂ්‍යයාගේ නම, නාම ලේඛණයෙන් ඉවත් කළ යුතුය.

iii. එසේ මාස 06 ක කාලසීමාවකට නිවාඩු ලබා විදෙස්ගත වූ සිසුවෙකු තව දුරටත්, සිය විදෙස් නිවාඩුව දීර්ඝ කර ගැනීමට අපේක්ෂා කරන්නේනම්, පිළිගත හැකි හේතු සහිතව ඉල්ලීම් කළ යුතුවේ. එසේ වුවද නිවාඩු දීර්ඝ කිරීම සඳහා ඉල්ලුම් කරන කාලසීමාව කිසිලෙසකින්වත් මාස 18 නොඉක්මවිය යුතුය.

iv. අවුරුදු 02 ක උපරිමය නිවාඩු ලබාගත් ශිෂ්‍යයකු තම නිවාඩුව අවසන්වීමෙන් පසු මාස 03 ක් ඇතුළත මෙරටට පැමිණියහොත්, නැවත එම පාසලට ඇතුළත්වීම සඳහා ඉල්ලුම් කිරීමට අවස්ථාවක් ලබාදිය හැකිය. එසේ ඉල්ලුම් කිරීමේදී එම සිසුවා/සිසුවියගේ ප්‍රගති වාර්තාවක් විදුහල්පති වෙත ඉදිරිපත් කළ යුතුවේ. ඒ අනුව ශිෂ්‍යයාගේ සුදුසුකම් පරීක්ෂා කර බලා, ඇතුළත් කළ යුතු ශ්‍රේණිය කුමක්දැයි තීරණය කිරීමට විදුහල්පති වග බලා ගත යුතුය. එහෙත් එම ශිෂ්‍යයා ඇතුළත් කළ හැකි වන්නේ එම පාසලේ පුරප්පාඩු තිබේනම් හා අදාළ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ හෝ මගේ අනුමැතිය සහිතව පමණි.

v. මෙසේ යම් ශිෂ්‍යයෙකු වසරකට වඩා වැඩි කාලයක් තුල නැවත දිවයිනට නොපැමිණෙන්නේ නම් අදාළ සිසුන් සඳහා දිගින් දිගටම පුරප්පාඩු තබා නොගත යුතු වේ. සිසුවකු සිසුවියක දීර්ඝ විදෙස් නිවාඩුවක් ලබා ඇති විටකදී වුවද අදාළ පන්තිවල ශිෂ්‍ය සංඛ්‍යාව චක්‍ර ලේඛයේ සඳහන් සංඛ්‍යාව ඉක්මවා ඇත්නම් විදෙස් නිවාඩු ලැබූ සිසුවා වෙනුවෙන් වෙනත් සිසුන් ඇතුළත් කිරීම නොකළ යුතු බව අවධාරණය කරමි.

vi. මින් ඉදිරියට මෙම චක්‍රලේඛය ප්‍රකාර කටයුතු කරන ලෙස මෙයින් දන්වමි.

වී.කේ. නානායක්කාර
ලේකම්
මානව සම්පත් සංවර්ධන, අධ්‍යාපන හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය